**ශීර්ෂය 198 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 198 - වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 සැප්තැම්බර් 11 දින අමාත්‍යාංශ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

## 2.1 විසර්ජන ගිණුම

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 13,703.21 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 5,592.99 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 8,110.22 ක් හෙවත් සියයට 59.18 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 434.59 | 408.37 | 26.22 | 6.03 |
| මූලධන | 13,268.62 | 5,184.62 | 8,084.00 | 60.93 |

| | | | | |
|---|---|---|---|---|
| එකතුව | 13,703.21 | 5,592.99 | 8,110.22 | 59.18 |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල විෂය අංක 19801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 8.5 | 8.47 | 6 | 6.96 | 31 | 24.75 |

**2.3 පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශය යටතේ වන පොදු තැන්පත් ගිණුම් 3 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 8.55 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0148/000 | 0.18 |
| 6000/0000/00/0016/0133/000 | 3.30 |
| 6000/0000/00/0018/0123/000 | 5.07 |
| | 8.55 |

## 2.4 විගණන නිරීක්ෂණය

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණි.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ජංගම නොවන වත්කම් ලේඛනය | මුදල් රෙගුලාසි 502(2) |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 04 කට 2017 ජූලි 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුම්වලට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු මිලියන .54.57 ක් විය.

### 3.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. මිලියන 1.60 ක් විය. එම හිඟහිටි ශේෂ වර්ෂ 01 සිට වර්ෂ 20 ක් දක්වා කාල පරාසයක් ගත වී තිබුණ ද ඒවා අය කර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 3.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

---

**අභ්‍යන්තර විගණනය**

---

අමාත්‍යාංශය යටතේ ආයතන 04 ක් ස්ථාපිත කර තිබුණ ද අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ ඉංජිනේරු සහකාරවරු දෙදෙනෙකුගෙන් පමණක් සමන්විත වී තිබුණි. එහෙත් අමාත්‍යාංශයේ කාර්යභාරය සමග සැසඳීමේ දී අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා අනුයුක්ත කර තිබුණු නිලධාරීන් සංඛ්‍යාව ප්‍රමාණවත් වී නොතිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

---

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණයේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---

ධාවන තත්ත්වයේ පවතින නමුත් ධාවනය නොකරන අමාත්‍යාංශය සතු වාහන 06 ක් සහ අලුත්වැඩියා කළ යුතු වාහන 05 ක් දීර්ඝ කාලයක් තිස්සේ වාරිමාර්ග දෙපාර්තමේන්තු භූමියේ නිෂ්කාර්යව ගාල් කර තිබුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

---

2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2017 ජුනි 30 දින වන විටත් එම වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

### (ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

---

විධිමත් ලෙස අයිතිය පවරාදීමකින් තොරව මෝටර් වාහන 67 ක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට ද 05 ක් ජල සම්පත් මණ්ඩලයට ද ලබා දී තිබුණි.

### (ඈ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

---

අමාත්‍යාංශයට අයත් කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනය, මහවැලි අධිකාරියට අයත් ඉඩමක හා ගොඩනැගිලිවල පවත්වාගෙන යනු ලබන අතර එම ඉඩම් හා ගොඩනැගිලිවල ඉදිකිරීම් කටයුතු සිදු කළ ද 2017 සැප්තැම්බර් 11 දින වන විටත් අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ) බේරුම් නොකළ බැරකම්**

---

අමාත්‍යාංශය විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. මිලියන 100.67 ක් වූ අතර එම බැරකම් පිළිබඳ විස්තර ලේඛනයක සටහන් කර නොතිබුණු බැවින් කාල විශ්ලේෂණයක් ලබා ගැනීමට නොහැකි විය. තවද සමාලෝචිත වර්ෂය අවසානයට පිළියෙල කර තිබුණු විසර්ජන ගිණුමේ රු.මිලියන 564.18 ක් වූ බැරකම් හෙළිදරව් කර නොතිබුණි.

**(ඊ) ශුද්ධ ප්‍රතිපාදන නොමැතිව බැරකම්වලට එළඹීම**

---

මුදල් රෙගුලාසි 94 විධිවිධාන ප්‍රකාරව බැදී ඇති බැරකම් සහ වැය කර තිබෙන මුළු වියදම එම වර්ෂයේ ශුද්ධ ප්‍රතිපාදනය නොඉක්මවිය යුතු වුව ද ශුද්ධ ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු.මිලියන 1.98 ක බැරකම්වලට ද ශුද්ධ ප්‍රතිපාදන නොමැතිව රු.මිලියන 1,43 ක බැරකම්වලට ද අමාත්‍යාංශය එළඹ තිබුණි.

**3.6 අනුකූල නොවීම්**

---

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---

නියැදි විගණන පරීක්ෂණවල දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 133 | - | අභ්‍යන්තර විගණනයක පරමාර්ථ, අභ්‍යන්තර විගණන ඒකකවල කාර්යයන් සහ ඒවායේ විෂය සීමාව පිළිබඳ වැදගත් කරුණු මුදල් රෙගුලාසිවල දක්වා තිබුණ ද දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය සඳහා පිහිටුවා තිබුණු අභ්‍යන්තර විගණන කමිටුව එපරිදි කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 139 | 104,997,160 | දේශගුණික අව බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතියේ ගෙවීම් වවුචර් නිසි පරිදි බලය සහිත නිලධාරියෙකු විසින් පරීක්ෂා කර ගෙවීම් කර නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| | (iii) මුදල් රෙගුලාසි 371 | 569,850 | කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනයේ අතුරු අග්‍රිමයන් මාණ්ඩලික නොවන ශ්‍රේණියේ නිලධාරීන්ට ලබා දී තිබුණි. |
| **(ආ)** | **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ** | | |
| | 2007 මැයි 11 දිනැති අංක 09/2007 චක්‍රලේඛය | 51,948,177 | කොත්මලේ ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථානයේ පුහුණු කටයුතු සඳහා අවශ්‍යවන නිළධාරීන් බඳවා ගැනීමට කටයුතු නොකර පෞද්ගලික සමාගමක් සමග ගිවිසුම්ගත වී විශ්‍රාමික නිළධාරීන්ගේ සේවය ලබා ගෙන චක්‍රලේඛයේ සීමාවන් ඉක්මවා ගෙවීම් කර තිබුණි. තව ද විශ්‍රාමික රජයේ නිළධාරීන් නැවත සේවයේ යෙදවිය හැකි උපරිම වයස් සීමාව අවුරුදු 67 ක් බව චක්‍රලේඛයේ සඳහන් වී තිබුණ ද කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනය එම වයස් සීමාව ඉක්මවන ලද නිළධාරීන් දෙදෙනෙකු සේවයේ යොදවා ගෙන තිබුණි. |

## 3.7 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේ දී අමාත්‍යාංශය විසින් විදේශ මූල්‍යාණය යටතේ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. එහි ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3,054 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 2,552.23 ක් උපයෝජනය කර තිබුණි. මීට අමතරව 2013 වර්ෂයේ දී අවසන් කළ යුතු වූ ව්‍යාපෘතියක් ද අමාත්‍යාංශය සතුව තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

### 3.7.1 දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

#### (අ) ව්‍යාපෘතියේ කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) තෝරාගත් ජලද්‍රෝණි 10 කට ආයෝජන සැලසුම් සහ ගං වතුර හා නියං තත්ත්වයන් සඳහා සැලසුම් සකස් කිරීමට සැලසුම් ඒකකයක් පිහිටුවීමට හා එම ඒකකයට අනුයුක්තව විශේෂඥ කණ්ඩායමක් සමඟ දේශීය මණ්ඩලයක් විසින් සැලසුම් සකස් කිරීමට අපේක්ෂා කළ ද 2016 දෙසැම්බර් 31 වන විට ජල ද්‍රෝණි 02 ක් සඳහා පමණක් ආයෝජන සැලසුම් සකස් කර තිබුණි.

(ii) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය මඟින් ක්‍රියාත්මක කළ පාසල් 18 ක නායයාම් තර්ජන අවම කිරීමේ කොන්ත්‍රාත් 12 කින් 04 ක් ආරම්භ කර තිබුණු අතර ඉන් එකක් පමණක් සම්පූර්ණ කර තිබුණි. අනිකුත් කොන්ත්‍රාත්වල ප්‍රගතිය සියයට 06 සිට සියයට 90 දක්වා පරාසයක පැවතුණි.

(iii) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගංවතුර හා නායයාම් නිසා සිදුවිය හැකි අපහසුතා මගහැරීමට සහ තර්ජනයට ලක්වූ පාලම් සහ බෝක්කු වැඩි දියුණු කිරීමට හඳුනාගත් පැකේජ 09 ක සහ තර්ජනයට ලක්වූ බැවුම් 07 ක වැඩි දියුණු කිරීමට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. ඉන් නැදිමලේ - බොරලැස්ගමුව පාලම ප්‍රතිසංස්කරණය කටයුතු සහ මඩකලපුව - ත්‍රිකුණාමලය මාර්ගයේ හා නුවර - මහියංගන මාර්ගයේ සංවර්ධන කටයුතු වල ප්‍රගතිය සියයට 35 සිට සියයට 85 පරාසයක පැවතුනි.

**(ආ) ව්‍යාපෘතිය විසින් උතුරු මැද පළාතේ සිදු කරනලද ඉදිකිරීම් පිළිබඳ ස්ථානීය පරීක්ෂණය**

----------------------------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නුවර වැව දකුණු ඉවුර වාන් ඇළෙහි වම්පස පැති බැම්මෙහි ස්ථාන 05 ක ඉරි තැලීම් පවතින බවත් එම ස්ථානයේ ම ඇළ පතුලේ සිට අඩි 1 ½ උසින් බැම්මේ ස්ථාන 05 කින් ජලය කාන්දු වී තිබුණි.

(ii) නුවර වැව පිටවාන ඇළ අසළින් ගමන් ගන්නා මාර්ගය මීටර් 850 ක් බොරළු පස් දමා තැලීම් සිදු කළ යුතු වුවත් එම මාර්ගය ආරම්භයේ මීටර් 100 ක් හා අවසානයේ මීටර් 250 ක් ඉදිකර නොතිබුණි. ඉදිකර තිබුණු මාර්ග කොටසේ ද වැසි ජලය පිටවාන ඇළට ගමන් කිරීමට සුදුසු කාණු පද්ධතියක් ඉදිකර නොතිබුණි.

(iii) තිසා වැව ප්‍රධාන නිර්මිතය ඉදි කිරීමේ හා වැඩි දියුණු කිරීමේ කාර්යයයේ 7 වන කෙත් ඇළ සහ කෘෂි පාර ඉදිකිරීමේ දී එම ඉදිකිරීම මීටර් 14 ක් අඩුවෙන් ඇස්තමේන්තු කර තිබීම නිසා සංවර්ධනයේ නියම ප්‍රතිලාභ මහජනතාවට ලැබී නොතිබුණි.

(iv) අභය වැවේ පිටවාන ඇළ සංවර්ධනය කිරීමේ දී පිටවාන ඇළ ගැඹුරු කර දෙපස බැම් වලට පස් පුරවා ප්‍රමාණවත් පරිදි තද කිරීම් හා ඊට සමාන්තර කෘෂි පාර සංවර්ධනය කිරීමට ඇස්තමේන්තු කර තිබුණි. නමුත් මීටර් 4,925 ක් දිග මෙම ඇළ මාර්ගයේ පුරා විද්‍යා ස්මාරක තිබීම නිසා මීටර් 3,117 ක ඉදිකිරීම් පුරා විද්‍යා දෙපාර්තමේන්තුව නතර කර තිබුණි. පසුව ඉදිකිරීම් කළ යුතු ආකාරය පුරා විද්‍යා දෙපාර්තමේන්තුව විසින් දන්වා තිබුණි. නමුත් එම උපදෙස් පරිදි කටයුතු කිරීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි. තවද ඇළේ අවසන් කොටස එනම් මීටර් 3,880 සිට මීටර් 4,925 දක්වා වූ අවසන් මීටර් 1,045 ට අදාල කෘෂි පාර ඉදිකර නොතිබුණි.

(v) පදවිය වැවේ D 16 සහ D17 යන ඇළවල් හා ඒ ආශ්‍රිතව අතිරික්ත වර්ෂා ජලය පිට කිරීමට ඉදිකර තිබුණු ජල පාලන සොරොවුවල හා මගී පාලම්වල කොන්ක්‍රීට් නියමිත ප්‍රමිතියට යොදා නොතිබුණු අතර ඒවායේ යකඩ කම්බි මතු වී මළ කෑමට ලක් වී තිබුණි.

**(ඇ) අරමුණුවලට පටහැනිව වියදම් දැරීම**

**-----------------------------------**

දේශගුණික අවදානම සඳහා විවෘත වන ජනතාව සහ වත්කම් පීඩාවට පත්වීම අවම කිරීම සහ ආපදාවලට ඵලදායීව ප්‍රතිචාර දැක්වීමට ග්‍රාහකයාගේ ධාරිතාවය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ විය. එසේ වුව ද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ගොවි ජනතාව දැණුවත් කිරීම සඳහා නුවරඑළියේ දී පැවති දින 03 ක වැඩ මුළුවක දී දේශගුණික අව බලපෑම් වලට ඔරොත්තුදීමේ අවශ්‍යතාවය පිළිබඳ ගොවි ප්‍රජාව දැණුවත් කිරීම සඳහා පැයක දේශනයක් පමණක් පවත්වා 2016 සැප්තැම්බර් 20 දින රු.621,300 ක මුදලක් ව්‍යාපෘතියේ අරමුදල් වලින් වැය කර තිබුණි.

## 3.7.2 නිවත්කම් දනන් වත්කම් දියුණුව හා බල ගැන්වීමේ ව්‍යාපෘතිය

**----------------------------------------------------------------------**

**ව්‍යාපෘතිය ඇවර කිරිම**

**-----------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මෙම ව්‍යාපෘතිය 2013 ඔක්තෝබර් 22 දින අවසන් කර තිබුණ ද ඇවර කිරීමේ කටයුතු 2017 ජුනි 30 දින වන විටත් නිම කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘති කාර්යයන් යටතට නොගැනෙන මහවැලි අධිකාරියේ නිරාවිය ගොවිපොළට පිළිවෙලින් රු. 7,300,000 ක සහ රු.15,675,310 ක පිරිවැයකට ෆුසෝ කැබ් රථයක් සහ ශීතකරණයක් සමඟ වැසියක් සහිත කිරි නිෂ්පාදන ඒකකයක් ව්‍යාපෘතිය ඇවර කිරීමේදී මිලදී ගෙන තිබුණි.

## 3.8 කාර්යසාධනය

**----------------**

**ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

**--------------------------------------------**

වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ විෂය පථයට අදාල නොවන ආරක්ෂක අමාත්‍යාංශයේ විෂය පථයට අදාල වන චීන රජයෙන් පෙරසවි ගොඩනැගිලි ආනයනය කිරීමේ කොන්ත්‍රාත්තුව සඳහා 2016 වර්ෂය සඳහා වෙන් කර දී තිබුණු රු.මිලියන 1,097.08 ක් වූ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1,091.15 ක මුදලක් වැය කර තිබුණි. මෙම කාර්යය සඳහා 2016 දෙසැම්බර් 31 දින වන විට රු. මිලියන 12,442.54 ක මුළු වියදමක් අමාත්‍යාංශය විසින් දරා තිබුණි.

## 3.9 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

අමාත්‍යාංශය විසින් සිදු කර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවල දී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශය විසින් ගිං නිල්වලා හැරවීමේ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 4,011.05 ක මුදලක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization advance) වශයෙන් විදේශීය සමාගමකට ගෙවා තිබුණ ද එම සමාගම සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි. වැඩ ආරම්භ කිරීමට අත්තිකාරම් ලෙස එ.ජ.ඩො. මිලියන 34.5ක් ගෙවිය යුතු වුව ද එ.ජ.ඩො. මිලියන 4.51 ක් අඩුවෙන් ගෙවා තිබුණි. වර්ෂ 2 ½ කට ආසන්න කාලයක් කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව විදේශීය සමාගමකට ඒකාබද්ධ අරමුදලින් ගෙවා තිබීම මතභේදාත්මක ස්වරූපයේ පැවතුනි. පැවති ස්ථාවර තැන්පත් පොලී අනුපාතය සියයට 13 ක් ලෙස ගතහොත් කොන්ත්‍රාත්කාර සමාගමට ගෙවා ඇති වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල ස්ථාවර තැන්පත් ගිණුමක වර්ෂ 2½ ක් ආයෝජනය කරන ලද්දේ නම් රු.මිලියන 1,303.59 ක පොලී ආදායමක් ඉපයීමට හැකියාව තිබුණි.

(ආ) කොත්මලේ ජාත්‍යාන්තර පුහුණු ආයතනයට පළමු අභ්‍යාසලාභී කණ්ඩායම ලෙස පනස් දෙදෙනෙකු බඳවා ගෙන තිබුණු අතර ඔවුන්ගේ ප්‍රතිඵල 2016 ජුනි මාසයේ දී නිකුත් කර තිබුණි. කෙසේ වුවද 2016 මාර්තු 08 දින වන විටත් ඔවුන් සේවයට අනුයුක්ත කර තිබීම ගැටළු සහගත බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ඇ) මහවැලි උපදේශක සේවා සමාගම සමග ඇති කරගෙන තිබුණු ගිවිසුමක් අනුව ආයතනයේ පුහුණු කටයුතු සඳහා කොන්ත්‍රාත් පදනම මත අනුයුක්ත කර තිබුණු විශ්‍රාමික ඉංජිනේරුවරයෙකු හට කිසිදු අනුමැතියකින් තොරව වාහනයක් රියදුරු සහිතව ලබා දී ඉන්ධන, අලුත්වැඩියා වියදම් සඳහා පමණක් 2016 සහ 2017 වර්ෂවල රු.593,232 ක මුදලක් ගෙවා තිබුණි. තවද 2016 නොවැම්බර් මාසයේ දී මහවැලි උපදේශක සේවා සමාගම සමග වූ සේවා ගිවිසුම අවසන් වූ පසුව ද අදාල ඉංජිනේරුවරයා හට ලබා දී තිබුණු වාහනය දෙසැම්බර් මාසය සඳහා ද ලබා දී ඉන්ධන වෙනුවෙන් රු.22,135 ක් ගෙවා තිබුණි.

(ඈ) සිරි දළදා යල් අස්වනු පූජාවට සහභාගී වූ නිලධාරීන් හට දිවා ආහාරය ලබා දීමේ දී එක් අයෙකුට රු. 2,500 ක වටිනාකමින් යුත් තම තමන් බෙදා ගත යුතු කෑම 200 ක් ද ගොවි නියෝජිතයන්ට එකක් රු. 250 ක වටිනාකමින් යුත් කෑම පාර්සල් 2,000 ක් ද ග්‍රෑන්ඩ් කැන්ඩියන් හෝටලයෙන් මිලදී ගෙන තිබුණි. සිරි දළදා යල් අස්වනු පූජාවේ ප්‍රධානතම කණ්ඩායම වන ගොවි ජනතාවට රු.250 ක් වූ කෑම පාර්සලයක් ලබා දී එක් නිලධාරියෙකුට තම තමන් බෙදා ගත යුතු රු. 2,500 ක් වූ දිවා ආහාරයක් ලබා දීමේ අවශ්‍යතාවය කුමක් ද යන්න විගණනයට පැහැදිළි නොවුණි.

**3.10 අවිධිමත් ගනුදෙනු**

---------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

------------------------------------------------------------

**(i)** ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණු අතර ප්‍රසම්පාදනය පිළිබඳ විස්තර සටහන් කිරීමට ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**(ii)** ප්‍රසම්පාදන කමිටුවේ සියලුම සාමාජිකයින් එකතු වී ප්‍රසම්පාදන තීරණ ගත යුතු වුව ද 2016 වර්ෂයේදී අවස්ථා 19 ක දී රු. 1,429,372 ක් වටිනාකම වූ භාණ්ඩ එලෙස සාමූහික තීරණ ගැනීමකින් තොරව ප්‍රසම්පාදනය කර තිබුණි.

**(ආ) අධිකාරී බලය නොමැති ගණුදෙනු**

-----------------------------------

සමාලෝචිත වර්ෂය තුල දී කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතනය තුළ සේවස්ථ පුහුණු වැඩසටහන් 36 ක් පවත්වා රු.9,309,225 ක් ආදායමක් උපයා තිබුණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 149 වැනි වගන්තියට පටහැනිව එම අදායම් ඒකාබද්ධ අරමුදලට ''බැර'' නොකර පොදු තැන්පත් ගිණුමට ''බැර'' කර වියදම් දරා තිබුණි. වැඩසටහන් පැවැත්වීමට අදාල වියදම් පිළිබඳ වාර්තා කිසිවක් ද පවත්වා නොතිබුණි.

**3.11 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු**

----------------------------------------

විදේශ සංචාරයක නිරත වූ අමාත්‍යාංශයේ උසස් නිලධාරීන් දෙදෙනෙකු කූඨ ලේඛනයක් උපයෝගී කර ගනිමින් රු.1,290,982 ක මුදලක් සංයුක්ත දීමනා සහ අනියම් දීමනා වශයෙන් ලබා ගෙන තිබුණි.

**3.12 කළමනාකරණ දුර්වලතා**

-------------------------

නියැදි විගණන පරීක්ෂණවල දී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2014 වර්ෂයේ දී අලුත්වැඩියා කටයුතු සඳහා මඩාටුගම යාන්ත්‍රික වැඩපල වෙත භාර දී තිබුණු නිසාන් බස් රථය සහ ජීප් රථය භාරදී වර්ෂ 03 කට අධික කාලයක් ගත වී තිබුණ ද කාර්යය ඉටු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2017 ජූලි 31 දින වන විටත් පසු විපරම් කටයුතු ද සිදු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ දී මඩාටුගම යාන්ත්‍රික වැඩපලෙන් අලුත්වැඩියා කරගෙන තිබුණු මෝටර් වාහනය නිසි පරිදි අලුත්වැඩියාව නොකිරීම හේතුකොටගෙන ආපසු යාන්ත්‍රික වැඩපලට භාර දී තිබුණි. එම වාහනයේ අලුත්වැඩියා කටයුතු නිම කරවා ගැනීමට 2017 ජූලි 31 දින දක්වා කටයුතු කර නොතිබුණි.

(ඈ) 2013 නොවැම්බර් 27 දින මෝටර් වාහනයක අලුත්වැඩියාව වෙනුවෙන් රු.778,500 ක් වූ ඇස්තමේන්තුවක් සඳහා රු.467,100 ක අත්තිකාරම් මුදලක් මඩාටුගම යාන්ත්‍රික වැඩපලට ගෙවා තිබුණ ද 2017 ජූලි 31 දින දක්වා ම අලුත්වැඩියා කර මෝටර් වාහනය භාරදී නොතිබුණු අතර 2017 ජූලි 31 දින වන විටත් පසුවිපරම් කටයුතු ද සිදු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේ දී මඩාටුගම යාන්ත්‍රික වැඩපලට වාහනයක් අලුත්වැඩියා කිරීම සඳහා භාර දී රු.330,000 ක ඇස්තමේන්තුවක් වෙනුවෙන් රු.448,200 ක මුදලක් ගෙවා තිබුණ ද එම කාර්යය නිම කර 2017 ජූලි දක්වා ම භාරදී නොතිබුණි.

(ඉ) කොත්මලේ ජාත්‍යන්තර පුහුණු ආයතන පරිශ්‍රය තුල සියලු පහසුකම් වලින් සමන්විත සංචාරක බංගලාවක් අධි සුඛෝපභෝගී පහසුකම් සහිතව නඩත්තු කර රාජකාරී කටයුතු, නිවාඩු සහ විවිධ උත්සව සඳහා විවිධ නිළධාරීන්ට සහ පුද්ගල කණ්ඩායම් වලට ලබා දී තිබුණ ද ඒ වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අය කර නොතිබුණි.

(ඊ) සිරි දළදා යල් අස්වනු පූජාව සඳහා රු.37,000 ක් වැය කර මිල දී ගත් පිත්තල පාත්තර සහ රු. 57,000 ක් වැය කර ලබා ගත් හකුළන මඩුව ගබඩා කර තිබෙන ස්ථානය විගණනයට අනාවරණය නොවුණි. එම පූජාව සඳහා ගොවි සංවිධාන 26 කින් රු.275,826 ක් ද රාජ්‍ය නිලධාරීන්ගෙන් රු.25,400 ක මුදලක් ද වශයෙන් රු.306,226 ක මුදලක් එකතු කර තිබුණ ද එම මුදල් ලද බවට ලදු පත් නිකුත් කර නොතිබුණු අතර ගිණුම්වල ද දක්වා නොතිබුණි.

## 3.13 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | ඌන සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 28 | 14 | 14 |
| (ii) | තෘතිය මට්ටම | 04 | 02 | 02 |
| (iii) | ද්විතීය මට්ටම | 54 | 32 | 22 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 36 | 23 | 13 |
| | එකතුව | **122** | **71** | **51** |

**(ආ) බාහිර පාර්ශවයන් වෙතින් ලබාගත් මානව සම්පත්**

**------------------------------------------------------------**

අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයේ දී හා ඉකුත් වර්ෂයේ දී ජල සම්පත් මණ්ඩලයෙන් සේවකයින් 06 දෙනෙකු ලබා ගෙන තිබුණු අතර ඔවුන්ගේ වැටුප් සහ දීමනා ලෙස රු.1,354,613 ක මුදලක් ජල සම්පත් මණ්ඩලයෙන් ගෙවා තිබුණි.

**(ඇ) මානව සම්පත් කළමනාකරුවකු බඳවා ගැනීම**

**-------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සඳහා මානව සම්පත් කළමනාකරුවකු බඳවා ගෙන කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 33 සහ 33 – 1 ට පටහැනිව වැටුප් ගෙවා තිබුණි.

(ii) බඳවා ගත් මානව සම්පත් කළමනාකරුගේ සේවා ස්ථානය ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වුවත් 2015 මැයි 25 දින සිට 2017 මැයි මස දක්වා මොනරාගල වාරිමාර්ග අධ්‍යක්ෂ කාර්යාලයට අනුයුක්ත කර රු.2,932,799 ක මුදලක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(iii) 2016 මාර්තු 24 දිනැති අංක 01/2006 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය අනුව 3 වන වසරේ දී ගෙවිය යුතු රු.103,000 ක වැටුප පළමු වර්ෂයේ සිට ගෙවා තිබුණු අතර 2016 මැයි සිට 2017 මැයි දක්වා රු.96,000 ක් වැටුප් ලෙස වැඩිපුර ගෙවා තිබුණි.